## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

# සබකෝලය සහ මනමාල බය

කොස්සින්න ශ්‍රී සීලානන්ද කණිෂ්ඨ විද්‍යාලයේ මා සමග හතරවෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලැබූවන් අතරින් මට දැන් දශක කිහිපයකට පසුව සිහි-වෙන්නේ කිහිප දෙනෙකු ගේ නම් පමණි. දැන් ඉංගිරිසි භාෂා ගුරුවරයෙකු වන නාලන්ද පියතිලක, කුමන ජීවනෝපායක යෙදෙන්නේ දැයි මා නොදන්නා සිසිල් පුෂ්පකුමාර මෙන්ම හෘදරෝග විශේෂඥවරියක වන රානිකා කිරිබත්ගොඩ ද මේ පන්තියේ දී සිසුන් අතර සිටි බව මගේ මතකයේ ඇත. ලයනල්, සුගත් සහ නිමල් ගුණරත්න යන (මේවා නම් සැබෑ නම් ය) නම් ද ඒ සමගම සිහියට නැගේ.

හතරවෙනි ශ්‍රේණියේ දී අපේ පන්තිය භාර ගුරුවරිය වූයේ මැ.පෙ. රූපසිංහ යි. කොණ්ඩය කලු නොකළ ඇය ඒ දිනවල විශ්‍රාම වයසට ළංවී සිටින්නට ඇතිය කියා මට සිතේ. ඇගේ නමේ සිංහල මුලකුරුවලින් අදහස් කෙරුණේ මැගිලින් පෙරේරා යැයි අපේ තාත්තා කී බවක් ද මගේ මතකයේ ඇත.

කණිෂ්ඨ විද්‍යාලයේ වැඩි වශයෙන්ම සේවය කළේ ගුරුවරියන් ය. අප ඔවුන් ඇමතුවේ "ටීචර්" යන වදනින් ය. පිරිමි ගුරුවරුන් සිටියේ දෙතුන් දෙනෙකි. ඔවුන් අතරින් කලිසම් අඳින අයට "සර්" කියා අමතන ලද අතර මගේ පියා මෙන් ජාතික ඇඳුම ඇඳි ගුරුවරුන් අමතනු ලැබුවේ මහත්තයා යනුවෙනි.

එක් දිනක් මැ.පෙ. රූපසිංහ ටීචර් අප අමතා, එදින සිට මසකට වරක් පන්තියේ සමිතියක් පැවැත්වෙන බව අපට දැනුම් දුන්නාය. මෙය සමහර විට ඊට කලින් වසරේ පාසලට පත්ව ආ නව මුල් ගුරුවරයා (විදුහල්පති ලා සිටියේ ඉහළ පාසල්වලය. කණිෂ්ඨ පාඨශාලාවල ලොක්කන් හැඳින්වුණේ මුල් ගුරු හෝ ලොකු මහත්තයා හෝ කියා ය) ගේ නියෝගයක් අනුව වූ දෙයක් විය හැක.

සමිතියක් යනු කුමක්දැයි මා නම් දැන ගත්තේ එදා ය. අපේ ටීචර් අපට විස්තර කර දුන් ආකාරයට, එය පන්තියේ සිසු සිසුවියන් ගේ රැස්වීමකි. මෙහිදී සිසුන් විසින් කවි, ගීත ගැයීම සහ කතා පැවැත්වීම යනාදිය කළ යුතුය.

සමිතියේ මූලාසනය හෙවත් සභාපති තනතුර නිල බලයෙන් හිමිවූයේ පන්තිය භාර ටීචර්ටයි. සමිතිය සඳහා ලේකම්වරයෙකු සිසු-සිසුවියන් අතරින් පත් කර ගත යුතු යැයි ද ටීචර් අපට සැළ කර සිටියා ය.
පන්ති කාමරයේ පිරිමි ළමුන් ගේ පැත්තේ ඉදිරිපස ආසනවල සිටියේ නාලන්ද, සිසිල් සහ මා බව මට මතකය. ලේකම්වරයෙකු ගැන ටීචර් කියූ සැණින් තම මුව විවර කළ දෙවෙනි පේළියේ සිටි ලයනල් රණසිංහ "රසික හොඳයි!" යැයි පවසා එලෙසින් මගේ නම මේ තනතුර සඳහා යෝජනා කළේය. වෙනත් යෝජනා නොමැති වූයෙන් මම ඒ තනතුරට නිතරගයෙන් පත් වුණෙමි.

පන්තියේ සමිතියේ ලේකම් ලෙස මගේ කාර්යභාරය කුමක් දැයි මැ.පෙ. රූපසිංහ ටීචර් මට විස්තර කර දෙන්නට ඇත.

ඊළඟට පන්තියේ සිසුන් ඇමතූ අපේ ටීචර් ඉල්ලා සිටියේ අද සමිතිවාරයේ දී කවි, ගී ගායනා කරන්නට, කතා පවත්වන්නට කැමති සිසුන්ට ඒ සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන ලෙසත්, ඊළඟ සතියේ එසේ කරන්නට කැමැත්තේ නම්, තමන් ගේ නම් සහ විස්තර සමිතියේ ලේකම් රසිකට පවසන ලෙසත් ය.

ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් කිහිප දෙනෙකු ම එදා කවි ගායනා කළ බව සහ සමිතියේ විස්තර සහ ඊළඟ මාසය සඳහා ඉදිරිපත් වූවන් ගේ තොරතුරු ද මා වෙනත් විෂයයක් සඳහා වූ අභ්‍යාස පොතට අග පිටුවේ සඳහන් කර ගත් බව ද මට මතකය.

නිවසට ගිය පසු මා කියූ මේ විස්තරය ඇසූ අම්මා ද කියා සිටියේ මා ලේකම් ලෙස සමිතියේ වාර්තාවක් ඊළඟ සභා වාරයට ඉදිරිපත් කළ යුතු බවයි.

එකී වාර්තාව ලිවිය යුතු ආකාරය පිළිබඳව තාත්තා මට උපදෙස් දුන්නේය.

"වර්ෂ එක්දහස් නමසිය හැත්තෑ හතරේ මැයි මස දහතුන්වෙනි සිකුරාද, කොස්සින්න ශ්‍රී සීලානන්ද කණිෂ්ඨ විද්‍යාලයේ හතර වෙනි ශ්‍රේණිය ඒ පන්තියේ දී පවත්වන්නට යෙදුණු ශිෂ්‍ය සමිතියේ වාර්තාවයි මේ."

"මෙදින රැස්වීමේ මුලසුන උසුලන ලද්දේ මැ.පෙ. රූපසිංහ ගුරුතුමිය විසිනි. ශිෂ්‍ය සමිතිය ආරම්භ කිරීමේ වැදගත්කම ගැන සිසුන්ට කියා දුන් ඇය, සෑම මාසයකටම වරක් සමිතිය පැවැත්වෙන බවත්, මෙහිදී කවි, ගීත ගායනා කිරීමට හෝ කතන්දර කීමට හෝ විවිධ මාතෘකා යටතේ කතා පැවැත්වීමට සිසුන්ට අවස්ථාව ලැබෙන බවත් පැවසූවාය."

"සමිතියේ ලේකම් තනතුරට, රසික හරිශ්චන්ද්‍ර ගේ නම ලයනල් රණසිංහ විසින් යෝජනා කරන ලද අතර නාලන්ද පියතිලක විසින් ස්ථිර කරන ලදී. වෙනත් නාම යෝජනා නොවූයෙන් හතරවෙනි ශ්‍රේණියේ ඒ පන්තියේ ශිෂ්‍ය සමිතියේ ලේකම් තනතුරට රසික හරිශ්චන්ද්‍ර නිතරගයෙන් තේරී පත්විය."

"දැන් ඔය විදියට එදා සමිතියේ දී වුණු සේරම විස්තර ලියපං විස්තර එක්ක. අන්තිමට වාර්තා කළේ උඹය කියලා උ ඹේ නම එකතු කරපං!" තාත්තා කිව්වේය.

මේ වාර්තාව ලිවීම මට, අකුරු, වචන, වාක්‍ය සහ භාෂාව සලකන කළ ලොකු දෙයක් නොවීය. අලුත් අභ්‍යාස පොතක් ගත් මම, පෙර කී මුල් විස්තරයට අමතරව තවත් වාක්‍ය කිහිපයකින් එතැන් සිට සමිතියේ අවසානය දක්වා සිදුවුණු දේ, කවි, ගීත ගායනා කළ, කතන්දර කියූ සිසු සිසුවියන් ගේ නම් සහ විස්තර ද සහිතව ගලපා ලියූවෙමි.

මාසයක් ගෙවී අපේ සමිතියේ දෙවන සභා වාරය උදාවිය.

"කවුද අපේ සමිතියේ ලේකම්, රසික නේද? දැන් එහෙනම්, රසික ඉස්සරහට ඇවිත් ඒ ලියපු වාර්තාව කියවන්න" මැ.පෙ. රූපසිංහ ගුරුවරිය සමිතිය ආරම්භ කරමින් කීවා ය.

මට කිසිසේත් ම, හිඳගෙන සිටි ආසනයෙන් නැගිට පන්තියේ ඉදිරියට යාමට සිත හද ගත නොහැකි විය.

"මා ලියූ වාර්තාවේ අඩුපාඩුවක් තිබේද? මා එය ලියා අවසාන කළා මිස පන්ති භාර ගුරුවරියට හෝ අඩු වශයෙන් තාත්තාට හෝ පෙන්නුවේ නැත. මා මේ වාර්තාව පන්තියේ ඉදිරියට ගොස් කියවන්නේ කෙසේද?"

මා පැකිළෙනු දුටු මැ.පෙ. රූපසිංහ ගුරුවරිය " ඇයි රසික වාර්තාව ලිව්වේ නැද්ද?" කියා මගෙන් විමසූවා ය.

සිතේ පිරි සබකෝලය, බිඳ වැටුණු ආත්ම විශ්-වාසය, ලැජ්ජාව, බිය, බඩේ සමනල්ලු, නළලේ ද බිඳු යනාදී සියළු අකලංචි මැදින් ම මට මගේ ගැලවුම් මාර්ගය ඒ වචන තුළින් පෙනුනි.
"ඔව් ටීචර්! ලියන්න බැරි වුණා!" මම මුමුණා කීවෙමි.

"හොඳයි, අද මුල් දවසනේ, කමක් නෑ, අද සමිතියේ වෙන දේවල්වල විස්තර හොඳින් ලියා ගෙන අද ම වාර්තාව ලියන්න" ඇය මා බේරා ගත්තා ය.

මේ සිද්ධිය හා සම්බන්ධව මගේ මතකයේ හොඳින් රැඳී ඇත්තේ තව එක දර්ශනයක් පමණි.

ඒ, පිටුපස පේළියේ සිටි ලයනල් රණසිංහ දෙසට හැරුණු නාලන්ද පියතිලක සහ සිසිල් පුෂ්පකුමාර දෙදෙනා, මගේ ඒ අසමත් වීම තමන්ට වූ මහා ලජ්ජාවක් සේ සිතා දෝ "මේ ලයියා තමයි සේරම කළේ!" යැයි ලයියාට දෝෂාරෝපණය කරන්නට පටන් ගැනීමයි.
සමිතියේ ලේකම් වීම විශාල ගෞරවණීය කාරණයක් බවත්, ඒ අවස්ථාව තමන්ට නො ලැබීම ගැන මගේ මිතුරන් වූ නාලන්ද පියතිලක සහ සිසිල් පුෂ්පකුමාර දෙදෙනා ඉතා කණගාටුවෙන් පසුවෙන බවත් ඒ දෝෂාරෝපණය කළ ආකාරයෙන් මට එවෙලේ වැටහිණි.

මම එදිනම සවස් වරුවේ, මුල් වර කළාටත් වඩා හොඳින්, අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ ගැන දන්නා තරමින් සැලකිලිමත් වෙමින් දෙවෙනි සමිතියේ වාර්තාව ලියූවෙමි. තුන් වෙනි සභා වාරයේ දී මම ඒ වාර්තාව වැඩි අපහසුවකින් තොරව කියවීමි.

මගේ ඒ සබකෝලය ටික දිනකින් අඩු වී ගිය ද, තව අවුරුදු දෙක තුනකට පසු ගැටවර වයසට පා තැබූ කාලයේ දී වෙනත් ආකාරයක කෝලයක් වැළඳී, එය සෑහෙන කාලයක් තිස්සේ ජීවිතයට වද දුන්නේ ය. මේ දෙවන කෝලය නම්, සම වයසේ කෙල්ලෙකු සමග වචනයක් හෝ කතා කිරීමට ඇතිවෙන බියයි, ලජ්ජාවයි, අපහසුවයි. මෙය සාමාන්‍යයෙන් ගැටවර වයසට එළැඹෙන බොහෝ පිරිමි ළමුන්ට වැළඳෙන සුවිශේෂී රෝගී තත්වයකි. මේ සංකීර්ණය ලියනගේ අමරකීර්ති විසින් තම "අටවක පුත්තු" නම් රාජ්‍ය සම්මානලාභී නවකතාවේ දී හඳුන්වා දී ඇත්තේ "මනමාල බිය" යනුවෙනි.

ඔබට "මනමාල බිය" වැළඳුණු විට එය දැන ගත හැකි මූලික රෝග ලක්ෂණ වෙන්නේ ගැහැණු ළමයෙකු දුටු විට, මුව ගොළුවීම, පිපාසයක් දැනීම, මදක් දහඩිය දැමීම, කකුල් වෙව්ලීම, හදවත සැලෙන නාදය කනට ඇසීම යනාදියයි. එසේම, ඕනෑම ගැහැණු ළමයෙකු සමග කතා කිරීමට අදාළව මනමාල බිය බලපාන්නේ නැත. එහි බලපෑමේ තීව්‍රතාවය අදාළ ගැහැණු ළමයා කෙරෙහි ඔබේ සිතේ ඇති මනමාලකමට සමා-නුපාතිකව අඩු වැඩි වේ.

ඒ සමගම, මේ මනමාල බිය නමැති රෝගී තත්වය වැළඳෙන්නේ පිරිමි ළමයින්ට පමණක් බව ද කිව යුතුය. මේ සම්බන්ධයෙන් ලෙ මිසරාබ්ල නම් ලෝ ප්‍රකට නවකතාවෙහි එහි රචක වික්ටර් හියුගෝ මෙසේ පවසයි.

"සැබෑ ආලයෙන් පෙළෙන පිරිමියෙකු ගේ ප්‍රථම රෝග ලක්ෂණය වෙන්නේ බියගුලුබවමුත් තරුණ කාන්තාවක ගේ නම් එය එඩිතරබව වේ. මෙය පුදුමයක් වුවද ඉතා සරල කරුණකි. මේ එකි-නෙකා කෙරෙහි යොමුවන විරුද්ධ ලිංගිකයින් අනෙකා ගේ ගතිගුණ ආරූඪ කරගන්නා ආකා-රයයි."

සබකෝලය හතරවෙනි ශ්‍රේණියේ දී ම පහව ගිය ද, ගැටවර වියේ දී වැළඳුණු මගේ "මනමාල බිය" නම් විශ්ව විද්‍යාලයේ දෙවන වසර මැද දක්වා ම පැවතුණි.



**මගේ ඒ සබකෝලය ටික දිනකින් අඩු වී ගිය ද, තව අවුරුදු දෙක තුනකට පසු ගැටවර වයසට පා තැබූ කාලයේ දී වෙනත් ආකාරයක කෝලයක් වැළඳී, එය සෑහෙන කාලයක් තිස්සේ ජීවිතයට වද දුන්නේ ය. මේ දෙවන කෝලය නම්, සම වයසේ කෙල්ලෙකු සමග වචනයක් හෝ කතා කිරීමට ඇතිවෙන බියයි, ලජ්ජාවයි,**

**Astrological Services**
By Ramya Attygalla
(over 20 years' experience)

Casting of Horoscope (Dala Kendera and/or Bawa Kendera)
Reading of Horoscope (Palapala)
Nekath for all occassions
Matching for compatibility (Porondam)
We do not use any software; all work is carried out by traditional methods.

**Readings will be sent via email, but please call if you require further details.**

Email: ramyaattygalla@gmail.com
Mobile Phone Numbers: 00 11 94 7117 90367 or 00 11 94 1127 00481
Local Inquiries: Chandini on 0422 31 2110 or 03 9798 6140
**Very reasonable charges.**
**Payments to a CBA Bank Account or via PayPal.**